**සි/ ඒ/6/1/16/8** **2021.10.**

චක්‍රලේඛය/**2021-1**

සියලුම සංස්කෘතික මධ්‍යස්ථාන භාර නිලධාරීන් වෙත

**<u>අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා නර්තන /සංගීත/චිත්‍ර/ තරගාවලිය</u>**

**<u>නර්තන තරගාවලිය - 2021</u>**

**හැඳින්වීම.**

දැයේ දූ දරුවන් සෞන්දර්ය අධ්‍යාපනයට නැඹුරු කරමින් ඔවුන්ගේ කලා කුසලතා වර්ධනය කරවීම මගින් සංවේදී සුචරිතවත් අනාගත පරපුරක් බිහිකරලීමේ අරමුණෙන් ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන කේන්ද්‍රකරගෙන පවත්වන සුවිශේෂී වැඩසටහනකි.

## <u>01.අරමුණ</u>

i. සාම්ප්‍රදායික නර්තනාංග සංරක්ෂණය සඳහා දිරි ගැන්වීම.
ii. නව නිර්මාණකරණය වෙනුවෙන් අවස්ථාව ලබාදීම.
iii. ප්‍රදේශයට ආවේණික සාම්ප්‍රදායික නර්තන අංග ජාතික තලයට ගෙන ඒමට අවස්ථාව ලබාදීම.
iv. සංස්කෘතික මධ්‍යස්ථානවල සිසුන්ට නර්තන ක්ෂේත්‍රයේ ඉදිරි පියවරක් තැබීමට අවස්ථාව ලබාදීම.
v. සංස්කෘතික මධ්‍යස්ථානවල ශක්‍යතාවයන් වර්ධනය කිරීම සඳහා අනුබලයක් ලබා දීම.
vi. සංස්කෘතික මධ්‍යස්ථාන ඇගයීම් නිර්ණායකයන් නිර්මාණය කර ගැනීම.
vii. සිසුන්ගේ සාමූහිකත්වය, සහභාගීත්වය වර්ධනය කිරීම තුලින් පෞරුෂ වර්ධනයට හා කුසලතාවන් සංවර්ධනයට ඉඩකඩ සැලසීම.
viii. රසඥතා සංවර්ධනයට මග පෑදීම
ix. ජයග්‍රහණය මෙන්ම පරාජය ද ජීවිතයේ අභිවෘද්ධියට යොමු කර ගැනීමට මග පෑදීම.

## <u>02.උපදෙස්</u>

i. 2021 වර්ෂයේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙවර ප්‍රතිභා තරගාවලිය සීමිත තරග ශිර්ෂ කිහිපයකට යටත්ව පැවැත්වීමට අදහස් කර ඇත.
ii. ඉදිරිපත්වන සෑම තරගකරුවෙක්ම සංස්කෘතික මධ්‍යස්ථානයේ 2020.01.01. සිට 2021.03.31 දින දක්වා ලියාපදිංචි වූ අයෙකු විය යුතුය.
iii. තරග පැවැත්වෙන දිනයන් ආසන්නයේ හෝ වෙනත් ආයතනයක සිසුන් ලියාපදිංචි කර තරග සඳහා ඉදිරිපත් කිරීම සම්පූර්ණයෙන් තහනම්ය.
iv. තරගවලට සහභාගී වීමේදී මධ්‍යස්ථානවල ලියාපදිංචි වී නොමැති සිසුන් ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවහොත් අදාළ මධ්‍යස්ථානය තරගයෙන් ඉවත් කරනු ලබන අතර ව්‍යාජ තොරතුරු සැපයීම සම්බන්ධයෙන් මධ්‍යස්ථාන නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කරනු ඇත. එමෙන්ම තරග අවලංගු කරනු ලබන මධ්‍යස්ථානයකට ශුරතාව හෝ අනුශුරතාව අහිමි වනු ඇත.

v. පළාත් මට්ටමේ හා ජාතික මට්ටමින් අදියර දෙකක් යටතේ තරගාවලිය පවත්වන අතර පළාත් තරගයේදී ලකුණු 70ට වැඩි පළමු ස්ථාන ලබා ගන්නා තරග ශීර්ෂ පමණක් ජාතික තරගය සඳහා සුදුසුකම් ලබනු ඇත. ජාතික තරගය පැවැත්වෙන ස්ථානය හා දිනය පසුව දන්වනු ලැබේ.

vi. පළාත් වටයෙහි තරග අංශයන් සඳහා සහභාගී වී ජයග්‍රහණය කරනු ලබන සාමාජික සිසුන් පමණක් ජාතික වටයේ තරග සඳහා ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර ජාතික තරගය සඳහා වෙනත් සිසුන් කණ්ඩායම්වලට ඇතුලත් කිරීම තරගයෙන් ඉවත් කිරීමට හේතුවේ.

vii. ජාතික තරගය සඳහා සුදුසුකම් ලැබූ සිසුන් රැගෙන ඒම සඳහා අමාත්‍යාංශය මගින් ප්‍රවාහන වියදම් ලබා දෙනු ඇත.

viii. තරග විනිශ්චය සඳහා චක්‍රලේඛය සමග යාකොට ඇති ලකුණු ලබාදීමේ පටිපාටිය උපයෝගී කරගනු ඇත.

ix. පළාත් තරගය පැවැත්වෙන දිනය වන විට යොමු කරන ලද නාමලේඛනයෙහි නම් වෙනස් වන්නේ නම් ඒ බව පිළිගතහැකි හේතු සමග විෂය භාර අතිරේක ලේකම් හෝ එම අංශයෙහි මාණ්ඩලික නිලධාරියකු දැනුවත් කර පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

x. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම් පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලැබේ.

xi. සංගීත/නර්තන දෙඅංශයම මධ්‍යස්ථානයෙහි ක්‍රියාත්මක වන්නේ නම් අංශ දෙකම නියෝජනය වන පරිදි අවම වශයෙන් එක් තරග ශීර්ෂයකට හෝ සිසුන් ඉදිරිපත් කළ යුතුය.

xii. කිසිදු තරගයකට ඉදිරිපත්නොවූ සංස්කෘතික මධ්‍යස්ථානවල සම්පත්දායක දීමනා නවතා දැමීමට කටයුතු කරනු ඇත.

xiii. ජාතික හැඳුනුම්පත/ තැපැල්හැඳුනුම්පත/ උප්පැන්න සහතිකයෙහි ඡායාපිටපතක් අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.

xiv. චක්‍රලේඛය සම්බන්ධයෙන්/ තරගාවලිය සම්බන්ධයෙන් යම් ගැටළුවක් ඇතිවුවහොත් ඒ පිළිබඳව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝ බලය පැවරූ අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන)ගේ තීරණය අවසන් තීරණය වේ.

## 03. තරග කොන්දේසි

i. සමස්ත තරගාවලියෙහි වයස් සීමාවන් පහත පරිදිවේ.
   - කනිෂ්ඨ අංශය - වයස අවුරුදු 11 - 15 අතර
   - ජ්‍යෙෂ්ඨ අංශය - වයස අවුරුදු 16 - 20 අතර
   - සීමිත අංශය - දැනට සේවයෙහි නියුතු සම්පත්දායකයින් සඳහා පමණි.

ii. ඒ අනුව මෙවර නර්තන/සංගීත තරගාවලියේ ඒකල තරග ශීර්ෂ පමණක් පවත්වනු ලැබේ.

iii. එක් මධ්‍යස්ථානයකින් වයස් සීමාවන් තුනම නියෝජනය වන පරිදි ( කණිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨ/ සීමිත) තරග ශිර්ෂ තුනකට සහභාගි විය හැකිය.

   උදා - කණිෂ්ඨ අංශය නියෝජනය කරමින් සහභාගි විය හැක්කේ එක් තරග ශිර්ෂයකට පමණි.

iv. තරග සඳහා වයස් සීමාවන් ගණනය කිරීම 2021 නොවැම්බර් 15 දිනට සැලකිය යුතුය.

v. එක් ශිෂ්‍යයෙකුට සහභාගී විය හැක්කේ තරග ශීර්ෂ එකකට පමණි.

vi. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී තරග ශිර්ෂ සඳහා වෙන වෙනම අයදුම් කිරීමට කටයුතු කරන්න.

vii. එකම දින තරග පැවැත්වෙන බැවින් තරග අංග වලට බාධා නොවන පරිදි සිසුන් තෝරාගත යුතුය.

viii. අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක ශිෂ්‍ය අනන්‍යතාවය පැහැදිලි කර ගැනීම සඳහා ලියාපදිංචි ලේඛනය ඉදිරිපත් කල යුතුය.

ix. අනන්‍යතාවය තහවුරු කිරීමට නොහැකි තරගකරුවන් සිටියහොත් ජයග්‍රහණය කළ ද අවලංගු කරනු ලැබේ.

x. ඒකල තරග ඉසව් සඳහා තරඟකරු සමඟ සහභාගී විය හැකි පිරිස උපරිම 04 කි.

xi. ඒකල තරග අංශයන් සඳහා අවමය විනාඩි 05 ත් උපරිමය විනාඩි 06ත් ලෙස සීමාවේ.

xii. සීමිත අංශය හැර අනෙක් සෑම තරග ශීර්ෂයක්ම සංස්කෘතික මධ්‍යස්ථාන ශිෂ්‍යයන්ට පමණක් සීමා වේ.

xiii. සෑම සම්පත්දායකයකු ම සීමිත අංශයෙන් පමණක් තරග කළ යුතුය. එහෙත් තමන් සේවය කරන මධ්‍යස්ථානයේ හෝ වෙනත් මධ්‍යස්ථානයක ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක ලෙස තරග කළ නොහැක.

xiv. පළාත් වටයෙන් ජාතික වටයට සුදුසුකම් ලබන්නේ ලකුණු 70 සීමාව ඉක්මවූ පළමු ස්ථානය පමණි. ජාතික හා පළාත් වටයේ සහතික පත්‍ර පිරිනැමීම ලකුණු 50 ක් ලබාගත් ප්‍රථම,දෙවන හා තෙවන ස්ථාන සඳහා පමණි.

xv. පලාත් තරග වටයේදී පුහුණු ඇඳුම් කට්ටලයෙන් සහභාගි විය හැකි අතර ජාතික තරග වටයේදී සුදුසු නර්තන ඇඳුම් කට්ටලයකින් සැරසී ඉදිරිපත් විය යුතුය.

xvi. පෙර වසර වලදී ප්‍රතිභා තරග සඳහා නිර්මාණය කළ නිර්මාණ ඉදිරිපත් නොකල යුතුය.

xvii. තරග නීතිරීති උල්ලංඝනය කිරීම පිළිබඳව ගැටලු ඇතිවුවහොත් ඒ අවස්ථා වලදී විධිමත් පරීක්ෂණයකින් පසුව අදාල තරග ප්‍රතිඵල අත්හිටුවීමට, සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට ප්‍රතිඵල ලේඛන වලින් ඉවත් කිරීම හෝ අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත විෂයභාර මාණ්ඩලික නිලධාරීන්ට සිදු කළ හැකිය.

## 04. සහතික හා සම්මාන ප්‍රදානය

I. පළාත් තරගාවලියෙන් ප්‍රථම,දෙවන සහ තෙවන ස්ථාන සඳහා සහතිකපත් පිරිනැමීම සිදුවේ.

II. ජාතික තරගයේ ප්‍රථම, දෙවන, තෙවන ස්ථානවලට සහතිකපත් හිමිවන අතර ලකුණු 70 ට වැඩියෙන් ලබාගෙන ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා තරග අංශය සඳහා පමණක් සම්මානයක් හිමිවේ.

III. සමස්ත තරගාවලියේම ලබා ගන්නා ස්ථානයන් පාදක කරගනිමින් ලබාදෙන ලකුණු අනුව වැඩිම ලකුණු ප්‍රතිශතය ලබා ගන්නා මධ්‍යස්ථානය සඳහා ශූරතාවය ද දෙවන ලකුණු මට්ටම ලබා ගන්නා මධ්‍යස්ථානය සඳහා අනු ශූරතාවය ද හිමිවේ.

## තරග ශීර්ෂ

### 01. කනිෂ්ඨ අංශය - අවුරුදු 11-15 ත් අතර

### 01. ශාස්ත්‍රීය - කණිෂ්ඨ - ඒකල

**1.1** උඩරට නර්තන සම්ප්‍රදාය

1.1.1 ගැහැණු - බුලත් පදය
1.1.2 පිරිමි - දුම්මල පදය

උපදෙස් -

- **ආලාර්ති පදය නැටීම අත්‍යවශ්‍ය නැත. සාම්ප්‍රදායික බව ආරක්ෂා විය යුතුය.**
- **ශාස්ත්‍රීය පද අන්තර්ගතය විනාඩි 04 – 05කට සංක්ෂිප්ත කර ගත යුතුය.**

**1.2** පහතරට නර්තන සම්ප්‍රදාය

1.2.1 ගැහැණු - දුම්මල පදය
1.2.2 පිරිමි - කොතල පදය

උපදෙස් -

- සාම්ප්‍රදායික පද කොටස් සහ ඊට නියමිත කවි ගායනා, නර්තනය කෙරෙහි සුවිශේෂී අවධානය යොමු කළ යුතුය.
- ප්‍රාසාංගික බව සහ නර්තනාලංකාරය සඳහා අවශ්‍යතාවයට අනුව තිත්රූපයට අදාලව අලංකාර පද යොදාගත හැකිය.

**1.3 සබරගමු නර්තන සම්ප්‍රදාය**

| | | | |
|---|---|---|---|
| 1.3.1 | ගැහැණු | - | සළු පදය |
| 1.3.2 | පිරිමි | - | ධූප පාලිය |

උපදෙස් -

- සම්ප්‍රදායානුකූලව ඉදිරිපත් කල යුතුය.
- නර්තනයට අදාල කවි ගායනා ඇසුරු කර ගනිමින් සාම්ප්‍රදායික ලක්ෂණ ඇතුළත් වන ලෙස සකස් කර ගත යුතුය.

1.4 ද්‍රවිඩ නර්තන - ඒකල

| | | | |
|---|---|---|---|
| 1.4.1 | ගැහැණු/පිරිමි | - | නඩේෂ කවුත්තම් |

උපදෙස් -

- තැටිගත කළ සංගීතය හෝ සජීවී සංගීතය යොදා ගත හැකිය.

## 02. <u>ජ්‍යෝෂ්ඨ අංශය - අවුරුදු 16-20 ත් අතර</u>

## 02. ශාස්ත්‍රීය - ජ්‍යෝෂ්ඨ - ඒකල

**2.1** උඩරට නර්තන සම්ප්‍රදාය

| | | | |
|---|---|---|---|
| **2.1.1** | **ගැහැණු** | **-** | **ඉරුගල් බණ්ඩාර කෝල්මුර** |
| **2.1.2** | **පිරිමි** | **-** | **වැදියක් කෝල්පාඩුව** |

**උපදෙස් -**

- **සාම්ප්‍රදායික බව ආරක්ෂා විය යුතුය.**
- අදාළ පද කොටස් සහ ඊට නියමිත කවි ගායනා, නර්තනය කෙරෙහි සුවිශේෂී අවධානය යොමු කළ යුතුය.

**2.2 පහතරට නර්තන සම්ප්‍රදාය**

| | | | |
|---|---|---|---|
| 2.2.1 | ගැහැණු | - | නාරිලතා |
| 2.2.2 | පිරිමි | - | කුමාර පෙළපාළිය |

උපදෙස් -

- සාම්ප්‍රදායික පද කොටස් සහ ඊට නියමිත කවි ගායනා, නර්තනය කෙරෙහි සුවිශේෂී අවධානය යොමු කළ යුතුය.
- ප්‍රාසාංගික බව සහ නර්තනාලංකාරය සඳහා අවශ්‍යතාවයට අනුව තිත් රූපයට අදාළව අලංකාර පද යොදාගත හැකිය.

- භාව ප්‍රකාශනය තිබිය යුතුය.

**2.3 සබරගමු නර්තන සම්ප්‍රදාය**

2.3.1 ගැහැණු - සළඹ ශාන්තිය
2.3.2 පිරිමි - තාල නවයේ ග්‍රහ පංති

උපදෙස් -

- සම්ප්‍රදායානුකූලව ඉදිරිපත් කළ යුතුය.
- නර්තනයට අදාළ කවි ගායනා ඇසුරු කර ගනිමින් සාම්ප්‍රදායික ලක්ෂණ ඇතුළත් වන ලෙස සකස් කර ගත යුතුය.

**2.4 ද්‍රවිඩ / මුස්ලිම් නර්තන - ඒකල**

2.4.1 ද්‍රවිඩ - ගැහැණු/පිරිමි - වර්ණම්
2.4.2 මුස්ලිම් - කෝලාට්ටම් රබන්

උපදෙස් -

- තැටිගත කළ සංගීතය හෝ සජීවී සංගීතය යොදා ගත හැකිය.

**2.5 බෙර වාදනය - ඒකල**

**2.5.1 උඩරට සම්ප්‍රදාය**

2.5.1.1 ගැහැණු - මඟුල් බෙර
2.5.1.2 පිරිමි - මඟුල් බෙර

**2.5.2 පහතරට සම්ප්‍රදාය**

2.5.2.1 ගැහැණු - මඟුල් බෙර
2.5.2.2 පිරිමි - මඟුල් බෙර

**2.5.3 සබරගමු සම්ප්‍රදාය**

2.5.3.1 ගැහැණු - මංගල දවුල් වාදනය
2.5.3.2 පිරිමි - මංගල දවුල් වාදනය

උපදෙස් -

- අදාළ සම්ප්‍රදායයන්ට අයත් මගුල් බෙර වට්ටම් ඇසුරු කරගනිමින් ක්‍රමානුකූල සම්බන්ධතාවයකින් යුත් වාදනයක් මෙහිදී අපේක්ෂා කෙරේ.
- නිවැරදි අවනද්ධාක්ෂර උත්පාදනය, සුරල් හා පෙරළුම්, ක්‍රමානුකූල පද සංයෝජනය පිළිබඳව විශේෂයෙන්ම සැලකිළිමත් විය යුතුය.
- ඉදිරිපත් විය හැකි උපරිම සාමාජික සංඛ්‍යාව 03කි.

**03. <u>සීමිත අංශය - දැනට සේවයේ නියුතු සම්පත්දායකයන්ට පමණි.</u>**

**3.1** **උඩරට නර්තන සම්ප්‍රදාය**

**3.1.1 ගැහැණු - කොහොඹා හැල්ල**
**3.1.2 පිරිමි - මඩුපුරය හා මල්හත්පදය**

**උපදෙස් -**

- **විවිධ තාල රූප හා සාම්ප්‍රදායික කවි ගායනා ප්‍රදර්ශනය විය යුතුය.**
- **ප්‍රාසාංගික ලක්ෂණ අන්තර්ගත විය යුතුය.**

**3.2** **පහතරට නර්තන සම්ප්‍රදාය**

3.2.1 ගැහැණු - නාග කන්‍යා
3.2.2 පිරිමි - පන්දම් පද

උපදෙස් -

- නර්තනයන්ට අදාළ නිශ්චිත ශාස්ත්‍රීය පද භාවිතා කළ යුතුය.
- පන්දම් පද නර්තනයේදී ශාස්ත්‍රීය පද සමග පන්දම් කරකැවීම වැනි ශිල්පීය කුසලතා ඇතුළත්ව ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රාසාංගික ලක්ෂණ අන්තර්ගත විය යුතුය.

**3.3** **සබරගමු නර්තන සම්ප්‍රදාය**

3.3.1 ගැහැණු - කෙණ්ඩි පාළිය
3.3.2 පිරිමි - දේවකෝල්පාඩුව

උපදෙස් -

- විවිධ තාල රූප හා සාම්ප්‍රදායික කවි ගායනා ප්‍රදර්ශනය විය යුතුය.
- නර්තනයන්ට අදාළ නිශ්චිත ශාස්ත්‍රීය පද භාවිතා කළ යුතුය.
- ප්‍රාසාංගික ලක්ෂණ අන්තර්ගත විය යුතුය.

දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන

ලේකම්,

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

## අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන පළාත්/ ජාතික නර්තන තරගාවලිය ලකුණු දීමේ නිර්ණායක

පළාත් ජාතික

**01.** **ශාස්ත්‍රීය - කණිෂ්ඨ - ඒකල**

( උඩරට/පහතරට/සබරගමු/ද්‍රවිඩ නර්තන)

| | | |
|---|---|---|
| ➢ නර්තනයට අදාළ සාම්ප්‍රදායික ලක්ෂණ සුරැකීම. | 20 | 20 |
| ➢ ගායන, වාදන, තාල, ලය නිවැරදි භාවිතය | 15 | 15 |
| ➢ නිවැරදි අංගහාර හා ශිල්පීය ප්‍රාගුණ්‍යය | 25 | 25 |
| ➢ අංග රටා, අවකාශ භාවිතය හා ප්‍රාසාංගික බව | 15 | 15 |
| ➢ ඉදිරිපත් කිරීම හා සමස්ත නිමාව | 25 | 20 |
| ➢ රංග වස්ත්‍රාභරණ නිර්මාණය | - | 05 |
| | 100 | 100 |

**02. ශාස්ත්‍රීය - ජ්‍යෙෂ්ඨ - ඒකල**

( උඩරට/පහතරට/සබරගමු/ද්‍රවිඩ නර්තන)

| | | |
|---|---|---|
| ➢ නර්තනයට අදාළ සාම්ප්‍රදායික ලක්ෂණ සුරැකීම. | 20 | 20 |
| ➢ ගායන, වාදන, තාල, ලය නිවැරදි භාවිතය | 15 | 15 |
| ➢ නිවැරදි අංගහාර හා ශිල්පීය ප්‍රාගුණ්‍යය | 25 | 25 |
| ➢ අංග රටා, අවකාශ භාවිතය හා ප්‍රාසාංගික බව | 15 | 15 |
| ➢ ඉදිරිපත් කිරීම හා සමස්ත නිමාව | 25 | 20 |
| ➢ රංග වස්ත්‍රාභරණ නිර්මාණය | - | 05 |
| | 100 | 100 |

**03. බෙර වාදනය - ජ්‍යෙෂ්ඨ - ඒකල**

| | | |
|---|---|---|
| ➢ සාම්ප්‍රදායික ලක්ෂණ | 25 | 25 |
| ➢ අක්ෂර වාදනයේ පැහැදිලි බව | 25 | 25 |
| ➢ පද සංයෝජනය | 25 | 25 |
| ➢ සමස්ත නිමාව හා ප්‍රාසාංගික බව | 25 | 20 |
| ➢ උචිත රංග වස්ත්‍රාභරණ | - | 05 |
| | 100 | 100 |

**04. ශාස්ත්‍රීය - සීමිත - ඒකල**

| | | |
|---|---|---|
| ➢ සාම්ප්‍රදායික බව | 25 | 25 |
| ➢ නිවැරදි අංගහාර | 20 | 20 |
| ➢ ගායනය/වාදනය හා තාල | 15 | 15 |
| ➢ කුසලතා | 15 | 15 |
| ➢ රංග වස්ත්‍රාභරණ භාවිතය | - | 05 |
| ➢ ඉදිරිපත් කිරීම හා සමස්ත නිමාව | 25 | 20 |

| | |
|---|---|
| 100 | 100 |

දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන
ලේකම්,
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.